සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො.191, ධර්මපාල මාවත, කොළඹ 07 | ஜே ஆர் ஜெயவர்தன மையம், 191, தர்மபால மாவத்தை, கொழும்பு 7
J.R. Jayewardene Center, No.191, Dharmapala Mawatha, Colombo 07

| මාගේ අංකය / எனது இல / My No. | ඔබගේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date | 2024.06. 28 |
|---|---|---|---|

**අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ වැඩසටහන යටතේ සංක්‍රාන්තික කාණ්ඩයේ සහ අවධානමට ලක් වූ කාණ්ඩයේ විශේෂ දීමනාව ගෙවීම**

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභී වැඩසටහනේ පළමු අදියරය යටතේ අවධානමට ලක් වූ කාණ්ඩය යටතේ සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන්ට රු. 5000 ක ප්‍රතිලාභයක් 2023 ජූලි මස සිට 2024.03.31 දක්වාත් සංක්‍රාන්ති කාණ්ඩය යටතේ සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් සඳහා රු. 2500 ක ප්‍රතිලාභයක් 2023 ජූලි මස සිට 2023.12.31 දක්වාත්, සුබසාධක ප්‍රතිලාභ පනත ප්‍රකාරව අනුමත කර තිබූ යෝජනා ක්‍රමය අනුව ගෙවීම් කරන ලදී.

වත්මන් ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගෙන සංක්‍රාන්තික කාණ්ඩයට සහ අවධානමට ලක් වූ කාණ්ඩයට තව දුරටත් සහන සැලසීමේ අවශ්‍යතාවය රජය විසින් වටහාගෙන 2024 ජුනි මස සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සංශෝධනය කර ඇත. එම යෝජනා ක්‍රමය අනුව 2024 ජුනි මාසය සඳහා සහනයක් වශයෙන් සංක්‍රාන්තික හා අවධානමට ලක් වූ කාණ්ඩය සඳහා විශේෂ දීමනාවක් ගෙවීමටත් 2024 ජූලි මස සිට 2024 දෙසැම්බර් මාසය දක්වා පමණක් එම කාණ්ඩ දෙක සඳහා මාසිකව රු. 5000 බැගින් ගෙවීමටත් තීරණය කර ඇත. අන්ත දිළිඳු හා දිළිඳු කාණ්ඩ සඳහා පවත්නා ගෙවීම් ක්‍රමය තව දුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

ඒ අනුව 2024 ජුනි මාසය සඳහා සංක්‍රාන්තික හා අවධානමට ලක් වූ කාණ්ඩවලට අයත් ඉහත සඳහන් ප්‍රතිලාභීන්ට විශේෂ දීමනාව ගෙවීම සඳහා රු. බිලියන 11.6 ක මුදලක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2024.06.27 දින ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම් වෙත මුදා හරින ලදී. මෙම විශේෂ දීමනාව ලබන සමස්ත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 622,495 කි.

කාර්යාලය / அலுவலகம் / Office — Tel: 009411- 2151481, 009411- 2484600/4117; Fax: 009411- 2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail — welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website — www.wbb.gov.lk